// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1636/8 – 2010 ජනවාරි 13 වැනි බදාදා – 2010.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: වෙන්/ප්‍රාලේ/ඉඅත්/90/1.
ඉඩම් හා ඉඩම් සං. අමා. යොමු අංකය එල්ඩී/05/2004/එච්ජ්/152..

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කම්මල්පත්තුව සුළු කොට්ඨාසයේ උතුරු උල්හිටියාව ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මු.පි.පු 4409 දරන පිඹුරේ සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.301ක් පමණවූ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි තුන (03)

කැබලි අංක 1
ඉඩමේ නම: බෙල්මොන්ට්වත්ත; විස්තරය: ගෙවත්ත; මුල් හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.080.

කැබලි අංක 2
ඉඩමේ නම: බෙල්මොන්ට්වත්ත; විස්තරය: ගෙවත්ත; මුල් හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.087.

කැබලි අංක 3
ඉඩමේ නම: බෙල්මොන්ට්වත්ත; විස්තරය: ගෙවත්ත; මුල් හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.134.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම, තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2010 පෙබරවාරි මස 24 වැනි දින පූ. භා. 10.00 ට වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2010 පෙබරවාරි මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්. එන්. බී. ඒ. කේ. එම්. එන්. ඩී. නාමරත්න,
ප්‍රාදේශීය ලේකම්,
වෙන්නප්පුව.

2010 ජනවාරි මස 01 වැනි දින,
වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 – 792

සංශෝධනයයි

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

2009.11.06 වැනි දින අංක 1626/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය පළ වූ දැන්වීම් අංක 11–606 දැන්වීමේ සඳහන් හිමිකම් පරීක්ෂණ දිනය ලෙස සඳහන් වී ඇති 2009 දෙසැම්බර් 09 වැනි දිනය “2010 මාර්තු මස 10 වැනි දින” ලෙසත් හිමිකම් ඉදිරිපත් කිරීමේ දිනය ලෙස සඳහන් වී ඇති 2009 දෙසැම්බර් මස 02 වැනි දිනය “2010 මාර්තු මස 03 වැනි දින” ලෙසත් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

ඩී. එම්. ඉන්ද්‍රා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
බණ්ඩාරවෙල.

2010 ජනවාරි මස 11 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
බණ්ඩාරවෙල.

01 – 788

ශුද්ධි පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: එල්/ඒ 281
ඉ. අමා. අංකය: එල්//03/ජේ/88/එල් ජී/67.

මොනරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් විසින් අංක 1579/23 හා 2008.12.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ යොමු අංක එල්/ඒ 281 යටතේ පළකරන ලද 2008.12.01 දින දරන නිවේදනයේ සඳහන් ඉඩමේ අයිතිවාසිකම් ඉදිරිපත් කිරීම සහ සම්මුඛ විය යුතු දිනය වශයෙන් යොදා ඇති 2009.01.15 දිනය 2010.02.26 දිනය වශයෙන්ද, හිමිකම් වෙනුවෙන් ඉල්ලීම් ඉදිරිපත් කළයුතු දිනය 2010.02.19 දිනය වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

කේ. එච්. ඒ. කේ. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
වැල්ලවාය.

2010 ජනවාරි මස 04 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
වැල්ලවාය

01 – 791

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි.